# විශ්ව නර්තන රේඛා 2009



විශ්ව රංගායතනය මෙල්බර්න් හි ඉතා ජනප්‍රිය නර්තන පාසලක්. විවිධ ශ්‍රී ලාංකීය උත්සව සඳහා විශ්ව රංගායතනයෙන් ඉදිරිපත් වන්නේ රසවත්, හරවත් නර්තනාංග යන්. අපේ අනන්‍යතාව මෙරට වැසියන්ට පෙන්වීමට ඇති ප්‍රබල මාධ්‍යයක් නර්තන කලාව. මෙල්බර්න් හි තිබෙන නර්තන පාසල් අතරින් අපේ සංස්කෘතික අනන්‍යතාව නිවැරදිව අපේ දරුවන්ට බෙදා දෙන, වටිනා නර්තනාංග අපට තිළිණ කරන, නර්තනයෙන් මෙල්බර්න් නුවර බබළවන විශ්ව රංගායතනයේ ගුරු මහත්මිය, සිසු දරු දැරියන් සහ දෙමව්පියන් සමඟ එක්ව අපට තවත් රසවත් නර්තන අත්දැකීමක් ලබා දෙන්නටයි මේ සූදානම් වන්නේ.

විශ්ව නර්තන රේඛා 2009 ප්‍රසංගය සැප්. 06 වන ඉරු දින සවස 6 ට මෙල්බර්න් හි බීසන් සෙන්ටර් වේදිකාව මත දිග හැරෙනවා. මෙම ප්‍රසංග ය ඔබ හමුවට ගෙන ඒමට විශ්ව රංගායතනයේ අධ්‍යක්ෂිකා රසිකා කුලසිංහ මහත්මියත්, දූ දරුවන් සහ දෙමාපියනුත් මාස ගණනාවක් තිස්සේ වෙහෙසෙනවා.

මේ පිළිබඳව විශ්ව රංගායතනයේ ශිෂ්‍යාවකගෙ ප මවක් අදහස් දැක්වූයේ මෙසේයි.

"අපේ අලුත් ප්‍රසංගය ගැන කතා කිරීමට පෙර මා සතුටුයි. විශ්ව නර්තන රේඛා 2005 සහ 2007 ප්‍රසංග ගැන කතා කිරීමට. විශ්ව නර්තන රේඛා 2005 මා නැරඹුවේ රසිකාවියක් විදිහටයි. ඒ වන විට මගේ දියණිය විශ්ව රංගායතනයේ සිසුවියකව සිටියේ නෑ. නමුත් අපි ඒ ප්‍රසංගය නැරඹුවා. එය මෙල්බර්න් නුවර මා දුටු ඉතාම ඉහළම නර්තන ප්‍රසංගයත්. අපූරු නර්තන රුසක් ඊට ඇතුළත් වුණා. එදා දුටු වන්නම්, වඩිග පටුන වැනි නර්තන අදත් මා මනසේ ඇඳී යනවා. ඇඳුම්, පැළඳුම්, වේදිකා සැරසිලි මේ සියල්ල ඉතා මැනවින් සකස් කොට තිබුණා.

2007 මාර්තු මස පැවැත් වූ විශ්ව නර්තන රේඛා 2007 ප්‍රසංගය ද ඉතා ඉහළින් පැවැත් වුණු ප්‍රසංග යක්. එහි ආරම්භක නර්තනය, සළුපාලිය, ලී කෙළි වැනි නර්තන ඉතා අසීරුවෙන් පුහුණු කළ වටිනා නර්තනාංග"

මෙවරත් විශ්ව නර්තන රේඛා 2009 පවත්වන්නට කටයුතු සූදානම් කර අවසානයි. මෙවර ප්‍රසංග යේදීත් ඔබ මනසේ සදා රැඳෙන නර්තනාංගයන් බොහොමයක් මීට ඇතුළත් වන බව නිසැකයි.

**විශ්ව නර්තන රේඛා 2009 ප්‍රසංග ය සැප්. 06 වන ඉරු දින සවස 6 ට මෙල්බර්න් හි බීසන් සෙන්ටර් වේදිකාව මත දිග හැරෙනවා.**





